# තනතුරු – ඇබෑර්තු

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### පුරප්පාඩු පිරවීම

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීමට සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) කළමණාකරන හා මූල්‍ය සහකාර
(ආ) වනසත්ව අඩවි ආරක්ෂක III
(ඇ) වනසත්ව නියාමක

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.–* මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

03. *සේවා කොන්දේසි .–* ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.

04. සාමාන්‍ය සුදුසුකම්:

(i) වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(iii) රාජකාරි අවශ්‍යතාවය මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ඔබ එකඟ විය යුතුය.

05. අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ වැටුප් පරිමාණයන් :–

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* | *වැටුප් ඛණ්ඩය හා පරිමාණය* |
|---|---|---|---|
| කළමනාකරණ හා මූල්‍ය සහකාර | පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ විද්‍යාව විද්‍යාවේදී හෝ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම. | 2005 වර්ෂයේ රැකියාලාභී උපාධිධාරී යෝජනා ක්‍රමය යටතේ දැනටමත් රාජ්‍ය ආයතන වල සේවයේ යෙදී සිටින අය විය යුතුය. | MN 4-2006 රු.1,78,200-14x රු. 2.,220-රු. 2,09,280 |
| වනසත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණිය | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 4 කින්සමත් වී සිටිය යුතුය. නව විෂය නිර්දේශය යටතේ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 03කින් සමත් වී සිටිය යුතුය. | අයදුම්කරුවන් උස අඩි 5 යි අඟල් 4ක් විය යුතු අතර, පපුව ප්‍රමාණය අඟල් 32ක් විය යුතුය. (හුස්ම නාල්ලා) බඳවා ගනු ලබන්නේ පිරිමි අයදුම්කරුවන් පමණි. | MN 1-2006 Step 6 රු. 1,62,240-1,440x9-රු. 1,680x4-රු. 1,81,920 |
| වනසත්ව නියාමක | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව ගණිතය හා තවත් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත්විය යුතු අතර එම විෂයයන් 06ට විද්‍යා විෂය හෝ කෘෂි විද්‍යා විෂය ඇතුළත් විය යුතුය. | අයදුම්කරුවන් උස අඩි 5යි අඟල් 4ක් විය යුතු අතර, පපුව ප්‍රමාණය අඟල් 32ක් හෝ ඊට වැඩි විය යුතුය. (හුස්ම නාල්ලා) බඳවා ගනු ලබන්නේ පිරිමි අයදුම්කරුවන් පමණි. | PL 2-2006 Step 7 රු. 1,53,600-12xරු. 1,320-රු. 1,69,440 |

06. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(අ) *කළමණාකරන හා මූල්‍ය සහකාර තනතුර .–*
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත උපරිම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

*සටහන .–* මෙම තනතුර සඳහා විභාග ගාස්තු ගෙවීම අදාල නොවේ.

(ආ) *වනසත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණිය තනතුර*
සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත විභාගයකට ලක් කරන අතර, ඉන් උපරිම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව 1:5 අනුපාතය මත ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමේ පරීක්ෂණයකට ලක් කරනු ලැබේ. අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා

ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් අනිවාර්යයෙන්ම සමත් විය යුතුය. තරග විභාගය සහ සම්මුඛ පරීක්ෂණ කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. මෙම විභාගය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, විභාග දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් හෝ වෙනත් පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලැබේ.

ශාරීරික යෝග්‍යතාවය සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයේ දී සහතික පත්‍ර පරීක්ෂා කිරීම පමණක් සිදු කරන අතර, විභාගයේ දී ලබාගන්නා කුසලතාවය මත පත් කිරීම සිදු කරනු ලැබේ.

*විභාග පරිපාටිය* :

(i) *සාමාන්‍ය දැනුම හා වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුම* .– පැය 01 උපරිම ලකුණු 100 යි. (අපේක්ෂකයන්ගේ වනජීවී සංරක්ෂණය පිළිබඳ ජාතික කලාපීය හා සමස්ත ලෝකයේ සංවිධාන පරිසරය පිළිබඳ දැනුම සමාජයේ සංස්කෘතික හා විද්‍යාත්මක දේශපාලනික ආර්ථික සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ දැනුවත් භාවය මැනෙන බහුවරණ විෂයානුබද්ධ කෙටි ප්‍රශ්න හා ව්‍යුහගත රචනා හා රචනා මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(ii) *බුද්ධි පරීක්ෂණය* .– පැය 01 උපරිම ලකුණු 100 යි (පද සංඛ්‍යා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු විශේෂයකි. අපේක්ෂකයන් දක්වන අනුමාන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළුව පිළිබඳව දුරවබෝධය ප්‍රමාණීකරණය හා කාලය සහ අවකාශය අතර සම්බන්ධතාවය වටහා ගැනීමේ ලා අපේක්ෂකයන්ගේ හැකියාව ඇගයීමට ලක් කරනු ලබන අතර, කෙටි ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.)

*සටහන* .–2006.02.17 දිනැති රජයේ *ගැසට් නිවේදනය* අනුව මුදල් ගෙවා අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා රු. 250 මුද්දර ඇලවිය යුතු නොවේ.

(*ඈ*) *වනසත්ව නියාමක තනතුර*

සියළුම අයදුම්කරුවන් තරග විභාගයකට ඉදිරිපත් කර එහි ප්‍රතිඵල මත සුදුස්සන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂාකර බඳවා ගනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය බුද්ධි පරීක්ෂණය සම්බන්ධ පැය 01ක ප්‍රශ්න පත්‍රයකි- උපරිම ලකුණු 100 කි. (මෙහිදී අපේක්ෂකයන්ගේ පද සංඛ්‍යා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු විශේෂයකි. අපේක්ෂකයන් දක්වන අනුමාන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳව දුරවබෝධය, ප්‍රමාණීකරනය සහ කාලය හා අවකාශය අතර, සම්බන්ධතාවය වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයන් සතු හැකියාව ඇගයීම.)

මෙම පරීක්ෂණය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් හෝ වෙනත් එවැනි පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලැබේ. ලිඛිත විභාගයෙන් උපරිම ලකුණු ලබාගන්නා අපේක්ෂකයන් 1:5 අනුපාතයට ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. මෙම ශාරීරික යෝග්‍යතාවය සමත් වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක් කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුව සලකා බලා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

07. *ඉල්ලුම් කළ යුතු ආකාරය* :

07.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තෙහි සකස් කරන ලද අයදුම්පත්‍ර 2008.01.15 දිනට ප්‍රථම ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අංක 382, නව නුවර පාර, මාළඹේ යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කර තිබිය යුතු අතර රජයේ හෝ වෙනත් ආයතනයක සේවය කරනු ලබන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු වේ. අයදුම්කරුවන් තනතුරු කිහිපයක් සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවලදී වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු වේ.

07.2 සෑම අයුරකින්ම සම්පූර්ණ නොවන මූලික සුදුසුකම් නොමැති සහ නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් සියල්ලම ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒවා ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

07.3 තැපැලේ දී ප්‍රමාද වන හෝ අස්ථානගත වන අයදුම්පත්‍ර සම්බන්ධව මෙම දෙපාර්තමේන්තුවෙහි වගකීමක් නොමැති බව ද සැළකිය යුතු වේ.

07.4 රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, පූජ්‍ය ස්ථානයක් භාර පූජකවරයෙකු, නීතිඥයෙකු හෝ රු. 2,37,060කට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුය.

08. *විභාග ගාස්තු* .– විභාග ගාස්තුව සඳහා රු. 250ක් වටිනා මුද්දර අයදුම්පතෙහි අදාල ස්ථානයේ අලවා අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන හා දිනය යොදා එම මුද්දර අවලංගු කළ යුතුය.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* .– යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු ඒ බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින්ම යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත. සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් නොකරන අපේක්ෂකයින් සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

